# වැදි ජනතාව පදනම්ව නව කෞතුකාගාර සංකල්පය භාවිතය

ඩබ්.ඩී.එස්.එල්. වීරසිංහ

පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

---

වර්තමානයේ කෞතුකාගාර විද්‍යාව ආශ්‍රිතව සාකච්ඡාවට බඳුන් වන සංකල්පයක් ලෙස නව කෞතුකාගාර සංකල්පය හැඳින්විය හැකිය. ගතානුගතික කෞතුකාගාර විධික්‍රමවලින් ඔබ්බට ගිය ධාරණීය බව අවබෝධ කරගත් තත් සංකල්පය ජීවමානත්වය, ප්‍රජාව හා භෞමික සීමාව යන සංකල්ප ත්‍රිත්වය මත පදනම් වේ. විශේෂයෙන්ම උරුමයක් ලෙස සැලකිය හැකි ජීවමාන ප්‍රජාවක් සම්බන්ධව සාකච්ඡා කිරීමේදී නව කෞතුකාගාර සංකල්පය වඩාත් කැපීපෙනේ. මෙම පර්යේෂණ මගින් ශ්‍රී ලංකාවේ ජීවත්වන ආදීවාසීන් නැතහොත් වැදි ප්‍රජාව පිළිබඳව අවදානය යොමු කරන අතර ඔවුන් ආශ්‍රිය කරගනිමින් තත් සංකල්පිත භාවිතාව විශ්ලේෂණයට ලක් කෙරේ. මෙම පර්යේෂණයේ නිරීක්ෂණයන්ට අනුව වැදි ජනතාව සංස්කෘතික අනුකලනයට ලක්ව සිටියද ඔවුන් ආශ්‍රිත ආයතනික ක්‍රියාකාරකම් තවදුරටත් ඔවුන්ගේ යටගියාව හා සබැඳෙන බව පෙනේ. විශේෂයෙන්ම ඔවුනට අනන්‍යවූ භෞමික අවකාශයක්, ප්‍රජාවක් හා නස්පර්ශිත උප ලක්ෂණයන්ගෙන් හෙබි සජීවී උරුමයක්ව පවතියි. එය ඔවුන් භාවිත කරන උපකරණ, තාක්ෂණය, භාෂාව හා වත්පිළිවෙත් ආශ්‍රයෙන් පෙන්නුම් කෙරේ. එහි එක් එක් ලක්ෂණ පිළිබඳව දැනුම ප්‍රවර්ධනය කළ හැකි නව දත්ත මෙම පර්යේෂණ මගින් තවදුරටත් සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : නව කෞතුකාගාර සංකල්පය, නස්පර්ශිත උරුම, වැදි ජනතාව